# හොරු අරන් ගිය දෙසැම්බර් 31





පසු ගිය දශක තුනක කාලය තුළ එක්සත් රාජධානියේ වෙසෙන ශ්‍රීලාංකිකයින් නත්තල සහ අවුරුදු උදාව සැමරූ ආකාරය ගැන සිතන විට අද මට පෙනෙන දේ ගැන කිසිවක් ලියන්නට අදහස් කළෙමි.

අප ශ්‍රීලංකාවේ ජීවත්වූ සමයේ වසර තිහකට එපිට දෙසැම්බර් 25 වෙනිදා උදාවන නත්තලේ සිට ඒ සති අන්තයේ 31 ද ගෙවී ජනවාරි 1 දා උදාවන තෙක් කිසි ආගම් භේදය කින් තොරව මුළු රටම එකම මගුල් ගෙදරක් මෙන් උත්සවශ්‍රීයකින් ඇලලී සිටි අයුරු මගේ මතයේ වෙයි. ඒ කාලයේ සංතෝෂය මිස කිසිදු දුකක් කණගාටුවක් අපට තිබුණේ නැත.

මා එංගලන්තයට පැමිණි මුල් වසරේ නත්තල් කාලය ළඟාවෙත්ම මගේ සිත කුතුහලයෙන් පිරීගියේ බහුතරයක් ක්‍රිස්තියානි වූ මේ සමාජය නත්තල කෙසේ සමරණවාද යන්න දැනගැන්මේ ආශාවෙනි. නත්තල් රැයේ මධ්‍යම රාත්‍රි පූජාවට කොළඹ පුරාද වත්තල මීගමුව කටාන ආදී පෙදෙස්වලද මොරටුව මග්ගොන ආදී නගරවල ද පල්ලිවලට ඇදී යන ක්‍රිස්තියානි බැතිමතුන්ගෙන් පාරවල් පිරී ඇති සැටි දැක තිබූ මට ලන්ඩන යේ නත්තල් රැයේ එසේ පාරේ ගමන් කරන සෙනග දකින්නට මම ඇහැ ඇරී සිටියෙමි. එහෙත් අනේ එවැනි සෙනගක සේයාවක් වත් නොවීය. පසුදා නත්තල් දිනයේද වැසුණු කඩ සාප්පු හා පාළු පාරවල් මිස කිසිදු නත්තල් සිරියක් දක්නට නොතිබිණ. අපේ රටේ වගේ නත්තල් උදාවන රැයෙන් පටන්ගෙන ජනවාරි පළමුවන දාට පහන්වනතුරු එක දිගටම දවස් ගණනක්ම බජව් සාජ්ජ දැමීමක් නොවීය. පසුව මට දැනගන්නට ලැබු ණේ එංගලන්තයේ නත්තල පවුලේ අයගේ ප්‍රීති උත්සවයකට පමණක් සීමා වූවක් බවය. දැන් වුවද මෙහි නත්තල් දිනයේ බස් සේවාවන් හා දුම්රිය සේවාවල සම්පූර්ණ ක්‍රියාකාරීත්වයක් නොවේ. එවැනි අකර්මණ්‍ය දිනයක් තවත් මා දැක නැත.

කාලයාගේ ඇවෑමෙන් අසූව දශකයේ සිට ක්‍රමයෙන් එංගලන්තයට එන ශ්‍රීලාංකිකයන්ගේ ගණන වැඩි විය. අපේ සෙනග බහුතරයක් ලංකාවේ නාගරිකව අපට තිබූ නත්තල සහ වර්ෂ අවසාන 31 රැය සමරණ උත්සවශ්‍රීය විඳගන්ට ආසාවෙන් මුලින් පවුල් කීපයක් එකතුව සිය නිවෙස්වල සාද පැවැත්වීම ඇරඹූහ. ඊළඟට එය ශාලාවක තුන්සීයක් හාරසීයක් පමණ ලාංකිකයින් සහභාගිවන ඩිනර් ඩාන්ස් දක්වා වර්ධනය විය. සිංහළ ගීත, බයිලා, ගයන සිංහළ වාදක යින්ද අඩංගු මෙම රාත්‍රී නැටුම් දෙසැම්බර් 31 වෙනිදා විශේෂ තැනක් ගත්තේය. මෙම සංවිධානයේ පුරෝගාමියෙකු ලෙස ලන්ඩනයේ සේවය කළ අප හිතවත් ශ්‍රීලාංකික ඉන්ජිනේරුවකු වන අභාවප්‍රාප්ත තිස්ස සෙනෙවිරත්න මහතා හැඳින් විය හැක. මිය යනතුරා වසර ගණනාවක්ම තිස්ස ලන්ඩනයේ හැමර්ස්මිත් නගර ශාලාවේ පැවැත් වූ දෙසැම්බර් 31 නැටුම් රාත්‍රිය ශ්‍රීලාංකිකයින් හැම වසරකම අග බලාපොරොත්තු වූ අතිශයින් ජනප්‍රිය අංගයක් වූ බව කිව යුතු ය.

කෙසේ හෝ දෙසැම්බර් 31 අද මෙන්ම ඒ කාලයේත් එංගලන්තයේ වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට විශේෂ දවසක් වූයේය. ඒ දිනය ආසන්න වෙත්ම කාගෙන් හෝ නැගෙන ප්‍රශ්නය මොකද 31 දා කරන්නේ යන්නයි. අපි යනවා ඇක්ටන්වල ඩාන්ස් එකට. අපි යනවා කිර්තිල ගෙ ගෙදර. අපි යනවා කැම්ඩන් ඩාන්ස් එකට අපි යනවා. ඔක්ස්පර්ඩ් වල පැට්‍රික්ලගෙ ගෙදර එහේ සීයක් විතර කස්ටිය එකතු වෙනවා. ඔය ආදී වශයෙන් සෑම ලාංකිකයෙක්ම ප්‍රීතිවන්නට ස්ථානයක්ද කලින්ම සොයාගෙනය. අපේ සිංහළ කාන්තාවන් ඒදින සාරිය අඳින්නටද පුල පුලා සිටින දවසකි.

එම 31 නැටුම් අවසන් වන්නේ රෑදොළහට ජනවාරි 1 වෙනි දා ලබනවාත් සමග ප්‍රීතිඝෝෂා සහිතව ෂැම්පේන් කඩාබොමින් එකිනෙකා සිප වැළඳගෙන කිරිබත් කෑලි කමින් සහ කවමින් සුබ නව වසරක් හෝ හැපි නිව් ඉයර් යයි කියමිනි. ඒ නැටුම් පොලේ සිට බොහෝ දෙනා මිතුරන් බලන්නට ඒ එළිවෙන ජාමයේ මිතුරු නිවෙස් වලට යෑමද සිදුවේ. මේ සිරිත මේ උද්‍යෝගය ලාංකික අප කා තුළත් හැම වසරකම නොඅඩුව තිබුණි. එහෙත් අද තත්වය කුමක්ද යන්න මට වඩාත් මෙනෙහිවුණේ මේ පහුවුණු දෙසැම්බර් 31 වෙනිදාය. අතීතයේ කෙළිදෙලෙන් ගත කළ බොහෝ දෙනෙකු දැන් 31 දා කොහේවත් යන්නේ නැත. යන්නට ප්ලෑන් කරන්නේද නැත. 31 වෙනිදා මොකද කරන්නේයයි කිසිවෙකුගෙන් අහන්නේ ද නැත.

එදා අප සමග සිටි බොහෝ දෙනෙකු අද නැත. සමහරු ලංකාවට පදිංචියට ගොස් සිටිති. බැලූ බැලූ තැන අළුත් මුහුණුය. අතීතයේ කඩිරව සියළු කාර්යයන්හි නිරතවූ ඒ හිතවත්තු දැන් ලෙඩ දුක්වලින් පෙළෙති. එදා තිබු උද්‍යෝගය අද ගව් ගණනකවත් නැත. ටෙලිපෝනයට පිළිතුරු දෙන්නේද අකමැත්තෙනි. මේ සියල්ලට හේතුව තාරුණ්‍යය අපෙන් දුරස්ව ගොස් ඇති නිසාද? නැතහොත් මේ නැටුම් ගැයුම් හා ප්‍රීතිය සේරම නිසරුදේ යයි අපට දැන් වඩාත් වැටහෙන නිසාද? එසේත් නැත්නම් එදා තිබූ අපේ ඒ විනෝදජනක සතුට හදිසියේම හොරු ගෙට වැදී අරගෙන ගිහිල්ලාද ? මට පැරණි කවියක් මෙහි දී සිහිපත් වෙයි.

එදා සිටිය අය කොයි අත ගියාද
ළිඳේ ජලය හිරු දැක සැඟ වුණාද
හිනාවෙන්න මට අමතක වුනාද
සිතේ සතුට හොරු අරගෙන ගියාද

♦ **විල්ප්‍රඩ් පෙරේරා**
**Berkshire UK**


**Duke's Court Travel**
DUKE'S COURT TRAVEL

## Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £365 + Taxes |
| QATAR AIRWAYS | Qatar Airways | fr £325 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £200 + Taxes |
| Emirates | Emirates | fr £445 + Taxes |
| ETIHAD | Etihad Airways | fr £314 + Taxes |
| OMAN AIR | Oman Air | fr £163 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

**020 8748 3535**

3045 PROTECTED · AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS · IATA

204 King Street, London W6 0RA


## NATIONAL DAY CELEBRATIONS - 2010

## 2010 ශ්‍රීලංකා නිදහස් උත්සවය

**සමරමින් කෙරෙන ආගමික වත්පිළිවෙත්**
**සහ ප්‍රීති උත්සවය සඳහා**
**එක්සත් රාජධානියේ ශ්‍රීලංකා මහකොමසාරිස්තුමා**
**විසින් ඔබ සැමට කරනු ලබන සුහද ආරාධනයයි**

**The High Commissioner for Sri Lanka**
cordially invites the Sri Lankan community
in the United Kingdom to participate
in the multi-faith religious observances followed
by a reception to celebrate
**the National Day of Sri Lanka**
on **Thursday 4th February 2010 at 9.30 am**
at the High Commission in London
All those who wish to participate are kindly requested to
inform **Ms Anoma / Ms Shantha**
on telephone number **020 7262 1841 ext. 239/240**
**Sri Lanka High Commission**
**13 Hyde Park Gardens**
**London W2 2LU**





**අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට සාමය සතුට පිරී, සුබ නව වසරක් වේවා!**

FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · HSBC · සම්පත් බැංකුව SampathBank · PEOPLE'S BANK · Standard Chartered

**020 8886 4488**
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි